**ශීර්ෂය 248 – සුරාබදු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 07 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,054.54 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 812.54 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 242.00 ක් හෙවත් සියයට 22.95 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 666.62 | 665.08 | 1.54 | 0.23 |
| මූලධන | 387.92 | 147.46 | 240.46 | 61.99 |
| **එකතුව** | **1,054.54** | **812.54** | **242.00** | **22.95** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 105,035.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 105,297.60 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 100.25 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | ඉක්මවීම / (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.02.04.01 | 105,000.00 | 105,263.55 | 263.55 | 0.25 |
| 10.02.06.00 | 35.00 | 34.05 | (0.95) | (2.71) |
| **එකතුව** | **105,035.00** | **105,297.60** | **262.60** | **0.25** |

**2.3 අත්තිකාරම් ගිණුම**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 24801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38.01 | 23.06 | 28.00 | 31.19 | 170.00 | 122.72 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0072/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 102.44 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 395.07 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0122/000 | 25.79 |
| 6000/0000/00/0002/0178/000 | 2.71 |
| 6000/0000/00/0016/0126/000 | 3.42 |
| 6000/0000/00/0018/0119/000 | 0.79 |
| 6000/0000/00/0008/0051/000 | 31.80 |
| 6000/0000/00/0006/0060/000 | 330.56 |
| **එකතුව** | **395.07** |

**2.6 විගණන නිරීක්ෂණය**

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වාගෙන යාම.**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි |
| (ii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පිළියෙල කර නොතිබුණි. |
| (iii) | වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි1645 (අ) | ලොග් පොත් පවත්වා නොතිබුණි. |
| (iv) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලින කර නොතිබුණි |

## 3.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) අංක 10.02.04.01 දරන ආදායම් සංකේතය - සුරාබද්ද (මත්පැන්)**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් අමාත්‍යාංශය විසින් ආදායම් සංකේතයට අදාළ බදු අයකිරීමේ ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල ඉහළ දැමීම නිසා ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 262.60 කින් ඉක්මවා ආදායම් රැස්කිරිමට හැකි වී තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.2,191,178, 421 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 1 ක සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

(iii) ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.මිලියන 36,175 කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී බදු අනුපාතය සියයට 7 කින් වැඩි කිරීම මෙසේ ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**(ආ) අංක 10.02.06.00 දරන අදායම් සංකේතය - දුම්කොළ බද්ද**

ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.මිලියනයකින් අඩු වී තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 24801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,995,281 ක් වූ අතර, එම හිඟහිටි ණයශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) සමාජික ණය ලේජරයේ (CC 10) නිලධාරින් විසින් ලබා ගෙන තිබුණු ආපදා ණයවලට අදාළ පොලිය මාසිකව සටහන් කර නොතිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව අසම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

**3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනිමට රු.මිලියන 29.8 ක ප්‍රතිපාදනද සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරිම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සියළු අංශ ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

**3.4.3 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන වැඩසටහන මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

(ආ) 2015 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව ප්‍රාදේශිය කාර්යාලවලට හා ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඇගයීමෙහිලා විශේෂ අවධානය යොමු කර ඇති බව සඳහන් කර තිබුණද, දෙපාර්තමේන්තු අණ පනත් සහ සුරාබදු නිවේදන යනාදිය පදනම් කරගත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ බවට ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වා දී තිබූ ඌනතාවයන් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදු කර අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.

(ඈ) 2015 වර්ෂයට අදාළව සුරාබදු තැගි අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂාවන් සිදුකළ බව සනාථ කෙරෙන සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | ---------------- | --------------- | ---------- | --------------------------- |
| | | | රු. | |
| (i) | වාහන ටයර් | 21 | 241,728 | අවුරුදු 05 |
| (ii) | පුස්තකාල පොත් | තොගයක් | 97,113 | අවුරුදු 03 |
| (iii) | මෝටර් වාහන | 01 | - | අවුරුදු 05 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතු වාහන පිළිබඳ සමීක්ෂණයක් කර, එම සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මඩකලපුව හා නුවරඑළිය නගරවල සුරාබදු ස්ථාන ඉදිකිරීම වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන සමාලෝචිත වර්ෂයේද පිළිවෙලින් රු.මිලියන 25 ක් හා රු.මිලියන 24 ක් වැයකර තිබුණි. එහෙත් එම ඉදිරිකිරීම් පිහිටි ඉඩම් විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණි. තවද, සුරාබදු ස්ථාන පවත්වාගෙන යනු ලබන ඉඩම් 11 කද, දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන දෙකකද, අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ එකට අඩු කාලයක සිට පැවැත එන රු.10,143,723 ක බැරකම් විය.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වන වගන්තිය | දුම්කොළ බදු තැගි අරමුදලක් ස්ථාපිත කළ යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1998 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය | සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් හා වෙනත් අයට තැගි මුදල් ගෙවීම සඳහා අනුමත ලිඛිත ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |

## 3.7 කාර්යසාධනය

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) කාර්මික අපරාධ වැටලීම්

--------------------------

සමාලෝචිත වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 4,932 ක් මඟින් රු.178,507,964 ක ආදායමක් උපයා තිබුණි. ඉකුත් වර්ෂයේදී සුරාබදු කාර්මික අපරාධ වැටලීම් 5,319 ක් මඟින් රු.163,101,331 ක ආදායමක් උපයා තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්මික අපරාධ වැටලීම් ආදායම රු.15,406,633 කින් හෙවත් සියයට 9 කින් වැඩිවී තිබුණු නමුත් වැටලීම් සංඛ්‍යාව 387 කින් හෙවත් සියයට 8 කින් අඩු වී තිබුණි

### (ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

-------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) රා රේන්ද බලපත්‍රලාභීන් විසින් නියමිත කලට අදාළ රා රේන්ද බලපත්‍ර ගාස්තු ගෙවන බවට තහවුරුවක් ලබා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදී නොතිබුණි.

(ii) 1994 මාර්තු 04 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 4.5 වගන්තිය ප්‍රකාරව නිර්හිත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.200,000 ක් වෙන් කර තිබුණද, 1994 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එවැනි ක්‍රියා සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කර නොතිබුණි.

(iii) දුම්කොළ බදු පනතේ 2 වන වගන්තිය අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සුරුට්ටුවක්, බීඩියක් හා සෑම පයිප්ප දුම්කොළ කිලෝ ග්‍රෑමයක් සඳහා බද්දක් පනවා අයකළ යුතු වුවත්, බීඩි නිෂ්පාදන ආයතන සම්බන්ධයෙන් කරනු ලැබූ නියදි විගණන පරීක්ෂාවේදී එවැනි බද්දක් අයකර නොතිබුණි. බීඩී නිෂ්පාදන ආයතන 590 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටි අතර, එම ආයතනනවලින් ඉල්ලුම් පත්‍ර ගාස්තු, බීඩි නිෂ්පාදන හා ගබඩා බලපත්‍ර ගාස්තු පමණක් අය කරනු ලබයි. ඊට අමතරව දුම්කොළ ආනයනය කරන ලද ආයතනවලින් ආනයනය කරන ලද දුම්කොළ වෙනුවෙන් අදාළ බදු මුදල්ද, ගෙවිය යුතු විය. මේ අනුව රජයට ලැබිය යුතුව පවතින ආදායම් අහිමි වී තිබූ අතර බීඩී නිෂ්පාදන ආයතන 26 ක සමාලෝචිත වර්ෂයේ දුම්කොළ පරිභෝජනය කි.ග්‍රෑ. 320,000 ක් විය. ඒ අනුව රජයට රු.3,200,000 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. ලියාපදිංචි වී ඇති ආයතන 590 සැලකිල්ලට ගත් කළ මෙලෙස වාර්ෂිකව විශාල බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

(iv) බීඩී නිෂ්පාදන බලපත්‍රවල වලංගු කාලය අවසන් වීමෙන් පසු බොහෝ නිෂ්පාදකයන් විසින් නැවත ලියාපදිංචිය අලුත් කිරිමට කටයුතු නොකල අවස්ථාවන් විය. සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි අලුත් කිරීමට කටයුතු නොකල ආයතන 10 ක්

පැවති අතර එම ආයතනවල නිෂ්පාදන කටයුතු සිදු කර නොතිබුණු බව දෙපාර්තමේන්තුව විසින් තහවුරු කරගෙන නොතිබුණි.

**3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

----------------------------------------

**ගැලපුම් කළයුතු ශේෂ**

---------------------------

බැංකු ගිණුම වෙත ඍජුව ලැබෙන මුදල් විධිමත්ව හඳුනාගෙන අදාළ ආදායම් සංකේතවලට ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.53,236,762 ක් හඳුනා නොගත් තැන්පත් ලෙස බැංකු සැසඳුමේ දක්වා තිබුණි. මෙම මුදලින් රු.2,633,125 ක් 2016 ජුලි 31 දින වන විටත් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) නිෂ්පාදනාගාර විසින් මත්පැන් නිකුත් කිරීමේදී ආදාළ සුරාබදු කොමසාරිස් කාර්යාලයට ඉන්වොයිස් පත්‍රිකාවල පිටපත් ලබා දිය යුතු වුවත්, එක් නිෂ්පාදනාගාරයක් විසින් එසේ කටයුතු කර නොතිබුණි. බලපත්‍ර ස්ථාන පරීක්ෂාවට සහභාගි වන නිලධාරීන් එම ඉන්වොයිස් පත්‍රිකාවල පිටපත් රැගෙන අදාළ පරීක්ෂණයන් සිදු කළ යුතු වුවත්, එසේ සිදුකර නොමැති බව සුරාබදු ස්ථාන සම්බන්ධව සිදු කළ නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එබැවින් බලපත්‍රලත් ස්ථානයට ලැබෙන මත්පැන් ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳ වාර්තාවල නිවැරදිතාවය විගණනයේදී තහවුරු වී නොතිබුණි.

(ආ) මාසික විශ්ලේෂණ වාර්තා හා අර්ධ වාර්ෂික විශ්ලේෂණ වාර්තා ලබා ගත යුතු බව දෙපාර්තමේන්තු නියෝග මගින් අවධාරණය කර තිබුණි. පරීක්ෂාවට ලක් කළ මත්පැන් නිෂ්පාදනාගාර 03 ක් සම්බන්ධයෙන් එම කටයුතු නිසි පරිදි සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් මත්පැන් සඳහා නියමකර ඇති සැර ප්‍රමාණය නියමිත පිරිවිතරයන්ට අනුකූලව අඩංගු වී තිබේද යන්න තහවුරු කර ගැනීම ගැටළුකාරී වී තිබුණි.

(ඇ) සුරාබදු බලපත්‍ර අළුත් කිරීමට ප්‍රථම කාර්මික අපරාධ වාර්තා නිරවුල් කළ යුතු වුවත්, කොළඹ විශේෂ මෙහෙයුම් ඒකකයේ 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නිරවුල් නොවූ කාර්මික අපරාධ සංඛ්‍යාව 70 ක් විය. නමුත් එම සුරාබදු බලපත්‍ර 70 දෙපාර්තමේන්තුව විසින් අළුත් කර තිබුණි.

**3.10 අවිධිමත් ගනුදෙනු**

----------------------

සුරාබදු නිවේදන අංක 920 ට අනුව සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය සහ අධීක්ෂණය සහිතව අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යනු ලබන හෝටල් සඳහා වයින්, බියර් සහ මධ්‍යසාර වර්ග අදාළ පරිශ්‍රය තුළ භාවිතා කිරීම සඳහා විශේෂ අනුමැතියක් දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණි. නමුත් එම සුරාබදු නිවේදනයට පටහැනිව සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලැබීමට පෙර වෙනත් ආයතනවල නිලධාරීන්ද එවැනි බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දී තිබුණි.

## 3.11 විසඳා නොතිබුණු විගණන ඡේද

---------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු 2.9(4) විගණන ඡේදය සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නිම කර නොතිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2011 ජුනි 21 දිනැති අංක 937 දරන සුරාබදු නිවේදනයට පටහැනිව මත්පැන් අපනයනය මත බදු ප්‍රතිදාන වශයෙන් රු.21,850,907 ක් ලබා දී තිබුණි. 2016 ජුලි 31 දින වන විට අදාළ සමාගම්වලින් රු.16,867,546 ක් හිලව් කර ගැනිමට කටයුතු කර තිබුණද, ඉතිරි මුදල වූ රු.4,983,361 ක් 2016 ජුලි 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාළ නිල ඇඳුම් රෙදි හා පාවහන් තොග දෙපාර්තමේන්තුව විසින් 2015 සැප්තැම්බර් 25 දින මිලදී ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එම තොග නිකුත් කිරීම අවසන් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන්ගේ නිල ඇඳුම් හා පාවහන් අවශ්‍යතාවය සපුරාලීමට දෙපාර්තමේන්තුව අපොහසත් වී තිබුණි.

(ඇ) 2011 මැයි 31 දිනැති අංක 936 දරන සුරාබදු නිවේදන යටතේ සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ හෝටල් සඳහා වයින්, බියර් හා පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කළ මධ්‍යසාර විකිණීම සඳහා විශේෂ අනුමැතියක් ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. එහෙත් එම හෝටල් සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක් 2011 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව සතු බස් රථය 2010 නොවැම්බර් 10 දින අනතුරට ලක් වී තිබුණු අතර එහි අළුත්වැඩියා කටයුතු සඳහා රු.590,450 ක් වැයකර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් වූ අලාභය බාහිර පාර්ශවයේ අදාල රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 පරිදි දෙපාර්තමේන්තුව විසින් තීරණය කර තිබුණි. නමුත් අදාළ රක්ෂණ සමාගම විසින් රු.116,120 ක් වන්දි ලෙස ගෙවීමට ඉදිරිපත් කරන ලද සමථ යෝජනාවටද දෙපාර්තමේන්තුව විසින් එකඟවීම හේතුවෙන් රු.474,330 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව සතු වෑන් රථයක් අනතුරකට ලක් වී 2015 ජනවාරි 26 දින අළුත්වැඩියා කටයුතු සඳහා නියෝජිත සමාගම වෙත යවා තිබුණි. අළුත්වැඩියා කටයුතු නිමවීමෙන් පසු නැවත එම වාහනය දෙපාර්තමේන්තුව වෙත 2016 ජනවාරි 22 දින ලැබී තිබුණි. මේ අනුව අළුත්වැඩියා කටයුතු සඳහා වසරක පමණ කාලයක් ගත වී තිබුණද, ප්‍රමාදය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කිසිදු සොයා බැලීමක් සිදු කර නොතිබුණි.

(ඊ) සුරා කර්මාන්ත අත්පොතෙහි 2 වැනි පරිච්ජේදයේ සඳහන් කරුණු අනුව සුරාබදු අධිකාරිවරයා විසින් තමාගේ බල ප්‍රදේශයට අයත් ගුදම්වල පොත්පත් පරීක්ෂා කිරීම මෙන්ම තොග පොත්වල ශේෂයන් අනිකුත් ශේෂයන් සමඟ සසඳා හරි වැරදි පරීක්ෂා කිරීම මාසිකව සිදු කල යුතු විය. එහෙත් ඒ අනුව කටයුතු කර නොතිබුණු බව ඒ පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**3.13** මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 41 | 16 |
| (ii) | තෘතියික මට්ටම | 380 | 300 | 80 |
| (iii) | ද්විතියික මට්ටම | 860 | 589 | 271 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 169 | 120 | 49 |
| | **එකතුව** | **1,466** | **1,050** | **416** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තනතුරෙහි ස්ථිර කර නොතිබුණු සුරාබදු පරීක්ෂක නිලධාරියෙකු වසර 5 කට අධික කාලයක් මුළුල්ලේ ස්වේච්ඡා නාවික හමුදාවේ සක්‍රීය සේවය සඳහා මුදා හැර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැන්පත් කළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සුරාබදු නියාමකවරුන් බඳවා ගැනීමට ගැසට් නිවේදනයක් නිකුත් කර, ලිඛිත විභාගය පවත්වා 2014 දෙසැම්බර් 31 දිනට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට දෙපාර්තමේන්තුව සැලැසුම් කර තිබුණද, එම සම්මුඛ පරීක්ෂණය 2015 දෙසැම්බර් මාසය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් සැලැසුම්ගත ලෙස සුරා බදු නියාමකවරුන් බඳවා ගැනීමට නොහැකි වී තිබුණි.